# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,915 - 2015 මැයි මස 15 වැනි සිකුරාදා - 2015.05.15**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — | රජයේ නිවේදන ... ... ... | 251 |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — | මිල පාලන දැන්වීම් ... ... ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 250 | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — | ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | 250 | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 252 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — | නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| | | සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.* - ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත සහ එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත 2015 මාර්තු මස 27 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයන් වශයෙන් පල කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 ජුනි මස 05 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 මැයි මස 22 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

249 – B 080947—302 (2015/05)
A 1-

## අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය

2015 අංක 118

අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්තික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ ඒ. ආර්. දේශප්‍රිය මහතා 2015 මාර්තු මස 04 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

එස්. අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

05 -410/1

2015 අංක 119

අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්තික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ එල්. කේ. ජී. ගුණවර්ධන මහතා 2015 පෙබරවාරි මස 25 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු සුරාබදු කොමසාරිස් ජනරාල් වශයෙන්.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

එස්. අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

05 -410/2

---

2015 අංක 120

අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්තික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ ඒ. එච්. කේ. ජගත් චන්ද්‍රසිරි මහතා 2015 මාර්තු මස 04 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් වශයෙන්.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

එස්. අබේසිංහ,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

05 -410/3

---

## වෙනත් පත්කිරීම් ආදිය

### ශ්‍රී ලංකා නාවික හමුදාව - නිත්‍ය නාවික බලකාය

අවමන් සහිතව නාවික හමුදා සේවයෙන් පහකිරීමක්

ශ්‍රී ලංකා නාවික හමුදා නිත්‍ය බලකායේ පහත නම සඳහන් නිලධාරියා 2015 මාර්තු මස 09 වැනි දින සිට අවමන් සහිතව නාවික හමුදා සේවයෙන් පහකෙරේ.

වැඩබලන උප ලුතිනන් (නාසෙ) මඩවල වික්‍රමසිංහ සෙනෙවිරත්න රාජකරුණා ඒකනායක මුදියන්සේ රාළහාමිලාගේ අනුද් කාවිංග මඩවල, එන්ආර්පී 1687, ශ්‍රීලංනාහ

එස්ඒඑම්ජේ පෙරේරා, ආර්ඩබ්පී, වීඑස්වී, යූඑස්පී, එන්ඩීසී, පීඑස්සී,
වයිස් අද්මිරාල්,
නාවික හමුදාධිපති.

2015 අප්‍රේල් මස 27 වැනි දින,
කොළඹ දී ය.

05 -414

2015 අංක 121

### ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය

අංශ අතර මාරුකිරීම

පහත නම සඳහන් නිලධාරියා 2015 මාර්තු මස 31 වැනි දින සිට උප ලුතිනන් නිලයේ ජ්‍යෙෂ්ඨතාවය 2014 ජුනි 03 දිනට සංශෝධනය කර විධායක අංශයේ සිට නැව්බද කාර්මික අංශය වෙත අංශ අතර මාරුකරන අතර, ඔහුගේ නව නිලය හා නිල අංකය පහත සඳහන් පරිදි වේ :-

උප ලුතිනන් (නැබ) නදුන් පද්ම වන්නිආරච්චි, එන්ආර්එච් 3529, ශ්‍රීලංනාහ

එස්ඒඑම්ජේ පෙරේරා, ආර්ඩබ්පී, වීඑස්වී, යූඑස්පී, එන්ඩීසී, පීඑස්සී,
වයිස් අද්මිරාල්,
නාවික හමුදාධිපති.

2015 අප්‍රේල් මස,
කොළඹ දී ය.

05 -415

# රජයේ නිවේදන

## උපකෘත (ඉංග්‍රීසි) පාසල් ව්‍යවස්ථා මාලාව යටතේ විශේෂ අවශ්‍යතා සහිත ළමයින් සඳහා වන පාසල් ලියාපදිංචි කිරීම පිළිබඳ නිවේදනය

උපකෘත පාසල් ව්‍යවස්ථාවෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව 2015.04.01 දින සිට බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීරිගම ඡන්ද කොට්ඨාසයේ, මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපයේ, බෝතලේ, අඹේපුස්ස, "අපේ ළමයි " විශේෂ පාසල, ශ්‍රවණ ඌනතා, දෘෂ්ටි ඌනතා, බුද්ධිමය ඌනතා, ඕටිසම් තත්වය, ඩවුන් සින්ඩ්‍රෝම තත්වය, කායික දුබලතා හා වෙනත් ඌනතා සහිත ළමයින් සඳහා වන උපකෘත විශේෂ පාසලක් ලෙස මා විසින් තාවකාලිකව ලියාපදිංචි කළ බවත්, ඩී. එම්. තිලකරත්න මහතා පාසලේ කළමනාකරු වශයෙන් පත්කර ඇති බවත්, මේ සඳහා විරෝධතා පවතින්නේ නම් දින 30ක් ඇතුළත අධ්‍යාපන ලේකම් වෙත යොමු කරන ලෙසත් මහජනතාවගේ දැනගැනීම සඳහා නිවේදනය කරනු ලැබේ.

උපාලි මාරසිංහ,  
ලේකම්,  
අධ්‍යාපන අමාත්‍යාංශය.

2015 අප්‍රේල් මස 27 වැනි දින,  
නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන ශාඛාව,  
ඉසුරුපාය,  
බත්තරමුල්ල.

05 - 420

---

*මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/19/2015/පිටු/සැ.*

## ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස්කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව/තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2015.05.08 වැනි දින සිට 2015.05.22 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැකිය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශකර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2015.05.29 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,  
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,  
අංක 234/ඒ3,  
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,  
බත්තරමුල්ල.

උපලේඛනය

| *ලියාපදිංචි පොත්වල කැඩීබිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ, | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, හේවාගම් කෝරළයේ හෝකන්දර පිහිටි "සරෝජිනී එස්ටේට්" නමැති ඉඩමට බලයලත් මානක | 01. | එම්. ඒ. ඇල්ලේපොල ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1983.11.18 දින අංක 2542 දරන විකුණුම්කරය |

| *ලියාපදිංචි පොත්වල කැඩිබිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| ජී කොට්ඨාසයේ 575 වෙළුමේ 253 පත් ඉරුව | එස්. වික්‍රමසිංහ මහතා විසින් 1982.07.14 දින මැන සාදන ලද අංක එච්/654 දරන පිඹුරේ ලොට් 21 සඳහා මායිම්,<br>*උතුරට* : ලොට් 16<br>*නැගෙනහිරට* : ලොට් 20<br>*දකුණට* : ලොට් 38 (පාර)<br>*බස්නාහිරට* : ලොට් 22 සහ පතිරණගේ සෑමීට අයිති ඉඩම<br>ප්‍රමාණය : අ. 00, රූ. 00, පර්. 21.8 | 02. වී. කේ. එල්. එස්. එන්. කේ. කුරුප්පුආරච්චි ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 2006.07.18 දින අංක 258 දරන විකුණුම්කරය |

05 -269

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**සම්පත් බැංකුව පීඑල්සී**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගන්තෙර ඉන්ධන පිරවුම්පළ.
ගිණුම් අංක : 0031 1000 4310.

සම්පත් බැංකුව පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2015 ක් වූ මාර්තු මස 26 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව්. 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. පී. ඩබ්ලිව්. ජයවීර යන අය විසින් ලියා සහතික කරන ලද 2007 නොවැම්බර් මස 15 දාතම හා අංක 4513 දරන, සී. ජී. බණ්ඩාර යන අය විසින් ලියා සහතික කරන ලද 2008 නොවැම්බර් 21 දාතම හා අංක 949 දරන හා කේ. එස්. පී. ඩබ්ලිව්. ජයවීර යන අය විසින් ලියා සහතික කරන ලද 2009 සැප්තැම්බර් 02 දාතම හා අංක 4959 දරන උකස් බැඳුම්කර මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ වල බඳුකර අයිතීන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ " ගන්තෙර ඉන්ධන පිරිවුම්පළ" යන ව්‍යවහාරික ව්‍යාපාර නාමය යටතේ කරගෙන යන ව්‍යාපාරයේ එකම අයිතිකරුවන් වන මුතමෙරිඥාගේ ප්‍රේම ශාන්ත යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 4513, 949 සහ 4959 දරන බැඳුම්කර ප්‍රකාර අයවිය යුතු මුලු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හැත්තෑ නම ලක්ෂ හතලිස් එක් දහස් එකසිය පනස් එකයි ශත හතලිස් හතරක (රු. 79,41,151.44) මුදලක් 2015 පෙබරවාරි මස 12 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් හැත්තෑ නම ලක්ෂ හතලිස් එක් දහස් එකසිය පනස් එකයි ශත හතලිස් හතරක (රු. 79,41,151.44) මුදල ද 2015 පෙබරවාරි මස 13 දින සිට අංක 4513, 949 සහ 4959 දරන එකී බැඳුම්කර මත අයවිය යුතු මුලු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක්ලක්ෂ අසූ දෙදහස් හාරසිය හැත්තෑ තුනක (රු. 1,82,473) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දොළහක් (12%) හා තවත් රුපියල් හැට හත් ලක්ෂ පනස් නම දහසක (රු. 67,59,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහහතක් (17%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 4513, 949 සහ 4959 දරන එකී බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් සහ සමරවික්‍රම ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

*උපලේඛනය*

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ පානදුර බැද්ද පානදුර ප්‍රාදේශීය සභා සීමාවන් තුළ (කෙසෙල්වත්ත උප කාර්යාලය) හොරේතුඩුව පිහිටි ගාලු පාර වරිපනම් අංක 720 දරන "හොරේතුඩුවේ කුරුඳුවත්ත නොහොත් ගොරකාගහලන්ද සහ පොකුණේවත්ත " යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. ආර්. එම්. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 2003 ජූලි 16 දාතම හා අංක 750 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් B වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ජී. ජී. නන්දසේන යන අය විසින් හිමිකම් කියනු ලබන වරිපනම් අංක 6 දරන දේපළ බී. ලියනගේ යන අය විසින් හිමිකම් කියනු ලබන අංක 37 දරන දේපළ සහ යූ. එල්. එස්. සිල්වා යන අය විසින් හිමිකම් කියනු ලබන වරිපනම් අංක 35 දරන දේපළ, නැගෙනහිරට : අංක 750 දරන එකී පිඹුරේ නිරූපිත ලොට් A, දකුණට : නිවාස වලට පාර සහ බස්නාහිරට : බලයලත් මානක තැන ඩී. ආර්. කුමාරගේ යන අය විසින් සාදන ලද 2002 නොවැම්බර් 24 දාතම හා අංක 1681 දරන පිඹුරේ නිරූපිත ලොට් 1A සහ අංක 750 දරන එකී පිඹුරේ නිරූපිත ලොට් C යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිහක් (අ. 0, රූ. 0, පර්. 30) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 750 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව F521/263 යටතේ පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් සමූහයේ ලේකම්.

05 -387

## සම්පත් බැංකුව පීඑල්සී

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලද සම්මුතිය

එම්. ඩී. එම්. එම්. හේවාගම.
ගිණුම් අංක : 0073 5000 1411.

සම්පත් බැංකුව පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2013 ක් වූ නොවැම්බර් මස 28 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව්. 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත අංක 110හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් කේ. එන්. කේ. කරුණාතිලක යන අය විසින් ලියා සහතික කරන ලද 2012 අගෝස්තු මස 29 දාතම හා අංක 328 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදලිගේ දොන් මැණික් මාධව හේවාගම යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 328 දරන බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුලු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් පනස් හයලක්ෂ එක් දහස් පන්සිය පහළවයි ශත අසූ අටක (රු. 56,01,515.88) මුදලක් 2013 නොවැම්බර් මස 05 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් පනස් හයලක්ෂ එක් දහස් පන්සිය පහළවයි ශත අසූ අටක (රු. 56,01,515.88) මුදල ද, 2013 නොවැම්බර් මස 06 දින සිට අංක 328 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුලු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හතලිස් අට ලක්ෂ හැටහය දහස් පන්සිය තිස් හයයි ශත අනූ හතක (රු. 48,66,536.97) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයක් (16%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 328 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන ) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරලේ, රාගම් පත්තුවේ, වත්තල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ හැඳළ පල්ලියවත්ත පිහිටි (කාර්මේල් මාවත) වරිපනම් අංක 4/A දරන "කිරුළගහදෙණිය කුරුඳුවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. ජී. ගුණතිලක යන අය විසින් සාදන ලද 2011 ජුනි 14 දාතම හා අංක 7463B දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් A/2 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් A/1, නැගෙනහිරට : ලොට් A/3, දකුණට : එස්. නානායක්කාරගේ ඉඩම සහ බස්නාහිරට : කාර්මේල් මාවත යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් අටයි දශම හයක් (අ. 0, රූ. 0, පර්. 8.6) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සහ සියළුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 7463B දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව B667/351 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් සමූහයේ ලේකම්.

05 -388

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී (ලියාපදිංචි අංක පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ගිණුම් අංකය : 1880011473
ණය ගිණුම් අංක : 476603, 946243, 1717165, 1719236, 1719238, 1723069, 1726322, 1726323 හා 1730388
හාලික් රයිස් මිල්ක්

2015 මාර්තු මස 30 වැනි දින පැවැත්වූ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් පරිදි විශේෂිතව හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී.

පොලොන්නරුව ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. එම්. රවුෆ් විසින් 2007.10.26 වැනි දින සහතික කරන ලද අංක 1521, 2008.02.27 වන දින අංක 1587, 2008.10.10 වන දින අංක 1679 සහ පොලොන්නරුව ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඒ. අබේවර්ධන විසින් සහතික කරන ලද 2011.11.03 වන දින අංක 1592 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්, දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී නමින් වූ බැඳුම්කරයන් යටතේ හාලික් රයිස් මිල් යන නාමය, විලාසය හා අභිධානය යටතේ හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන කන්දේ ගෙදර අසීස් මොහොමඩ් හාරිස් නොහොත් කන්දේ ගෙදර මොහොමඩ් අසීස් මොහොමඩ් හාරිස් සහ කන්දේ ගෙදර අබ්දුල් හාලික් නොහොත් කන්දේ ගෙදර මොහොමඩ් අසීස් අබ්දුල් හාලික් යන අය බන්ධනදායීන් වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත ගෙවිය යුතුව හා අයවිය යුතුව ඇති මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් හත්කෝටි හැත්තෑ අටලක්ෂ තිස් තුන් දහස් හාරසිය හතලිස් එකයි ශත හතරක (රු. 77,833,441.04) ක මුදලක් 2014.12.19 වන දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් හත්කෝටි හැත්තෑ අටලක්ෂ තිස් තුන් දහස් හාරසිය හතලිස් එකයි ශත හතරක (රු. 77,833,441.04) ක මුදල හා 2014.12.20 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 11,387,052.63ක මුදලක් සඳහා වාර්ෂිකව 24% බැගින් වූ පොළිය ද රුපියල් 13,510,000 සඳහා වාර්ෂිකව 6.5%ක පොළියක් ද, රුපියල් 13,500,000 සඳහා වාර්ෂික 8.91% (PLR+1%) හා රු. 35,000,000 මුදලට වාර්ෂිකව 12.5% බැගින් වූ පොළිය ද ප්‍රචාරක වියදම් හා වෙනත් යම් ගෙවීමක් ඇතොත් ඒවාද මේ වන විට කරනු ලැබූ (යම්) ගෙවීමක් ඇතොත් එය ද අඩු කර අයකර ගැනීම සඳහා එකී අංක 1521, 1587, 1679 සහ 1592 දරන බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත උකස් කර ඇති මෙහි පහත උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කරන ලද දේපළ හා පරිශ්‍රයන් මහනුවර, මාවිල්මඩ, ලේවැල්ල පාර, දුටුගැමුණු මාවතේ,

අංක 369/1 හි බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ පැවරී ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් සම්මත කර ගනී.

### උපලේඛනය

1. උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුව පළාතේ, මැදපත්තුව තෝපා වැව තුලානේ තෝපා වැව ගමේ පිහිටි මිනිපිටියේ කැලේ නැමැති ඉඩමට බලයලත් මානක ඒ. දොලොස්වල විසින් 1979.07.31 වැනි දින අංක 2777/A දරන පිඹුරේ නිරූපිත ලොට් ඒ නැමැති ඉඩම් කොටසට මායිම්, එනම්, ඊසාන දෙසට : මෙම ඉඩමේ ඉතිරි කොටසින් ද, ගිණිකොණදෙසින් : බැස්ටියන් යන අය විසින් හිමිකම් කියන කුඹුරෙන් ද, දකුණට : ඉහත කී පිඹුරේ නිරූපිත ලොට් බී වෙන් කරන ඇලෙන් ද සහ වයඹදෙසින් රක්ෂිත ප්‍රදේශයෙන් හා වටරවුම් පාරෙන් ද යන මෙකී මායිම් තුළ පිහිටි රූඩ් තුනයි, පර්චස් දහසයක් (අ. 0, රූ. 3, පර්. 16) විශාල ඉඩම හා එහි තුළ පිහිටි ගහකොළ, වගාව, ගොඩනැගිලි ඇතුලු සියලු දේ මෙය පොළොන්නරුව ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව A32/181හි ලියාපදිංචි කර ඇත.

2. උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුව පළාතේ, මැදපත්තුව තෝපා වැව තුලානේ තෝපා වැව ගමේ පිහිටි මිනිපිටියේ කැලේ නැමැති ඉඩමට බලයලත් මානක ආර්. බී. අබේකෝන් විසින් 1990.12.13 වැනි දින සාදන ලද අංක 517 දරන පිඹුරේ නිරූපිත ලොට් 2 නමැති ඉඩම් කොටසට මායිම්, එනම් උතුරට : පිඹුරු අංක 517හි සඳහන් ලොට් 1න් ද, නැගෙනහිරට : පිඹුරු අංක 517හි සඳහන් ලොට් 3න් ද, දකුණට : බලයලත් මානක ඒ. දොලොස්වල විසින් 1979 ජනවාරි 29 දින සාදන ලද අංක 2777A සඳහන් ලොට් A ගෙන් ද හා බස්නාහිරට : මාර්ග ප්‍රවේශය සහ ප්‍රධාන මාර්ගයේ සිට නවනගරය වටරවුම් පාරෙන් ද යන මෙකී මායිම් තුළ රූඩ් එකයි. පර්චස් තිස් එකක් (අ. 0, රූ. 1, පර්. 31) විශාල ඉඩම හා එහි තුළ පිහිටි ගහකොළ, වගාව, ගොඩනැගිලි ඇතුළු සියලු දේ මෙය පොළොන්නරුව ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව A30/277හි ලියාපදිංචි කර ඇත.

3. උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුව පළාතේ, මැදපත්තුව තෝපා වැව තුලානේ තෝපා වැව ගමේ පිහිටි මිනිපිටියේ කැලේ නැමැති ඉඩමට බලයලත් මානක ආර්. බී. අබේකෝන් විසින් 1990.12.13 වැනි දින සාදල ලද අංක 517 දරන පිඹුරේ නිරූපිත ලොට් 3 නමැති ඉඩම් කොටසට මායිම්, එනම් උතුරට : පිඹුරු අංක 517හි සඳහන් ලොට් 1න් ද, නැගෙනහිරට : ඉහත කී පිඹුරේ නිරූපිත ලොට් 4න් ද, දකුණට : ඉහත කී පිඹුරේ නිරූපිත ලොට් 4 සහ ඇලෙන් ද හා බටහිරට : ඉහත කී පිඹුරු අංක 2777Aහි නිරූපිත ලොට් 4න් ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් දහහතක් (අ. 0, රූ. 0, පර්. 17) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගහකොළ, වගාව, ගොඩනැගිල්ල ඇතුළු සියලු දේ. මෙය පොළොන්නරුව ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව A30/282හි ලියාපදිංචි කර ඇත.

4. උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුව පළාතේ, මැදපත්තුව තෝපා වැව තුලානේ තෝපා වැව ගමේ පිහිටි මිනිපිටියේ කැලේ නැමැති ඉඩමට බලයලත් මානක ඩී. මුදුන්කොත්ගේ විසින් 1993.08.22 වැනි දින සාදල ලද අංක 2000 දරන පිඹුරේ නිරූපිත ලොට් 1 නමැති ඉඩම් කොටසට මායිම්, එනම් උතුරට : මෙම ඉඩමේ ඉතිරි කොටසින් ද, නැගෙනහිරට : කිරිහාමි සහ තවත් අය හිමිකම් කියන කුඹුරෙන් ද, දකුණට : බලයලත් මානක ඩී. මුදුන්කොත්ගේ විසින් 1991.10.06 වැනි දින සාදන ලද අංක 1151 දරන පිඹුරේ නිරූපිත ලොට් 2න් ද හා බස්නාහිරට : හාලික් හාල් මෝලට අයිති ඉඩමෙන් ද යන මෙකී මායිම් තුළ පිහිටි අක්කර එකයි, රූඩ් එකකින් (අ. 1, රූ. 1, පර්. 0) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගහකොළ, වගාව, ගොඩනැගිල්ල ඇතුලු සියලු දේ. මෙය පොළොන්නරුව ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව A30/283හි ලියාපදිංචි කර ඇත.

5. උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, තමන්කඩුව පළාතේ, මැදපත්තුව තෝපා වැව තුලානේ තෝපා වැව ගමේ පිහිටි මිනිපිටියේ කැලේ නැමැති ඉඩමට බලයලත් මානක ඩී. මුදුන්කොත්ගේ විසින් 1995.11.09 වැනි දින සාදල ලද අංක 1246 දරන පිඹුරේ නිරූපිත ලොට් 1 නමැති ඉඩම් කොටසට මායිම්, එනම් උතුරට : බලයලත් මානක කුමාරසාමි විසින් 1962.06.21 වැනි දින සාදන ලද අංක 2905 පිඹුරේ ලොට් A ගෙන් ද, නැගෙනහිරට : කිරිහාමි විසින් හිමිකම් කියන කුඹුරෙන් ද, දකුණට : ඩී. මුදුන්කොත්ගේ විසින් 1993.08.22 වැනි දින සාදන ලද අංක 2000 දරන පිඹුරේ නිරූපිත ලොට් 1න් ද හා බස්නාහිරට : බලයලත් මානක කේ. කුමාරසාමි විසින් 1962.06.21 වැනි දින අංක 2095 දරන පිඹුරේ නිරූපිත ලොට් E (මෙම ඉඩමේ ඉතිරි කොටස) සහ බලයලත් මානක ආර්. බී. අබේකෝන් විසින් 1990.12.13 වැනි දින අංක 517 දරන පිඹුරේ නිරූපිත ලොට් 1, 2. 3 ද සහ බලයලත් මානක ඩී. මුදුන්කොත්ගේ විසින් 1993.08.22 වැනි දින අංක 2000 දරන පිඹුරේ නිරූපිත ලොට් 1න් ද යන මෙකී මායිම් තුළ පිහිටි අක්කර එකයි, රූඩ් දෙකයි, පර්චස් තිහක් (අ. 1, රූ. 2, පර්. 30) විශාල ඉඩම (මෙය වැරදීමකින් ප්‍ර. නො. ජී. එස්. හරිස්චන්ද්‍ර විසින් 1995.07.01 වැනි දින ලියා සහතික කරන ලද ඔප්පු අංක 1003හි සඳහන්ව ඇත්තේ අක්කර එකයි, රූඩ් තුනයි, පර්චස් තිහක් ලෙසින් ය) ඉහත පිඹුරු අංක 1246 පරිදි පොළොන්නරුව ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව A32/182හි ලියාපදිංචි කර ඇත.

රංජනී ගමගේ මිය,
සමාගම් ලේකම්.

05 -376

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.